TRANSPARENCY INTERNATIONAL SRI LANKA
Building a Nation of Integrity

Media Release 2009/Sin/4

**මාධ්‍ය නිවේදනය** 2009.01.21

**<u>ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මාර්ක් ප්‍රනාන්දු මහතාගේ අභාවය පිළිබඳව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා සාතිශය සංවේගය පළකරයි.</u>**

සුපිළිපන්භාවය හා ආදර්ශමත් ක්‍රියා පටිපාටිය අතින් අතිවිශිෂ්ට ගණයෙහිලා සැලකිය හැකි ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකු වූ මාර්ක් ප්‍රනානදු මහතාගේ අභාවය පිළිබඳව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය සාතිශය සංවේගය පළකරයි.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙකු වශයෙන් එතුමා විසින් ලබාදෙන ලද තීන්දු රටේ විනිවිදභාවය හා යහපාලනය කෙරෙහි පුළුල් හා ප්‍රගතිශීලී බලපෑමක් ඇති කළ අතර පරිපාලන හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියේ පෙරළිකාර වෙනසක් ඇති කිරීමට හේතුවූ බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා හි විශ්වාසයයි.

රටතුළ අරාජිකභාවයක් ඇති වන හා නීතියේ ආධිපත්‍යය පිරිහෙන අවස්ථාවල ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින් දක්වමින් ඔහු ප්‍රකාශ කළේ "හොඳ මිනිස්සු 100 ක් ඒ ගැන කල්පනාකර ක්‍රියාත්මක වන්නේ නම් එම තත්ත්වය වෙනස් කළ හැකි බවයි".

ශ්‍රේෂ්ඨාධිකරණයට ඔහු අනවශ්‍ය බවට ඔහු තුළ ඇති වී තිබූ හැඟීම මත නොයෙක් පුද්ගලයින් හා වෘත්තිකයින්ගේ දැඩි විරෝධය නොතකා නියමිත කාලයට පෙර විශ්‍රාම ගත් එතුමා, අභාවයට පත්වන අවස්ථාව වන තෙක්ම ආදර්ශමත් පුරවැසියෙකු වශයෙන් තමන්ගෙන් රටට ඉටුවියයුතු වගකීම් ඉටුකරමින් සිටියේය.

ඍජු හා අගතිගාමී නොවූ අධිකරණ තීන්දු ලබාදෙමින් සිදුකරන ලද විශිෂ්ට මෙහෙය සම්බන්ධයෙන් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය එතුමන් වෙත සිය ගෞරවය හා ආචාරය පුද කර සිටී.